කාලය මිනිත්තු 30 යි.

නිපුණතාව 9.0 - ආයතනයක ගිණුම් වාර්තා අසම්පූර්ණ වූ විටත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

නිපුණතා මට්ටම 9.1 - අසම්පූර්ණ සටහන් පැහැදිලි කර එයට හේතු ඉදිරිපත් කරයි.

<u>හැඳින්වීම -</u>

ව්‍යාපාරයක ගිණුම් සටහන් තැබීමේදී පිළිගත් ද්විත්ව සටහන් න්‍යාය අනුව සටහන් පවත්වා නොගන්නා ඕනෑම සටහන් ක්‍රමයක් අසම්පූර්ණ වාර්තා ලෙස හැඳින්වේ.එනම් ව්‍යාපාර ආයතනයක හට ගන්නා සියලු ගනුදෙනු හා සිදුවීම් ද්විත්ව සටහන් ක්‍රමය භාවිත කර ක්‍රමවත්ව වාර්තා කර නොමැති තත්ත්වයකි.

<u>අසම්පූර්ණ සටහන්වලින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම</u>

විවිධ හේතූන් මත ඇතැම් ව්‍යාපාර ක්‍රමවත් ගිණුම් පද්ධතියක් හා ක්‍රමයක් අනුගමනය නොකරන නමුත් ඇතැම්විට ව්‍යාපාරයට මූල්‍ය අවශ්‍යතා සම්පාදනය කර ගැනීම වැනි අවස්ථාවලදී ව්‍යාපාරයේ ලාභදායීත්වය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ ණය සපයන ආයතන සලකා බලයි.මෙවැනි අවස්ථාවලදී ව්‍යාපාරයට ක්‍රමවත් ගිණුම් පද්ධතියක අවශ්‍යතාවය මතු වේ.

නමුත් අසම්පූර්ණ වාර්තා පවත්වා ගෙන යන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට තොරතුරු හඳුනාගැනීම පහසු කටයුත්තක් නොවේ.මෙහිදී ක්‍රමවත් නොවන සීමිත තොරතුරු භාවිත කර අවශ්‍ය අනෙකුත් තොරතුරු තක්සේරු කර ලාභය/අලාභය ගණනය කිරීම හා මූල්‍ය තත්ත්වය පෙන්නුම් කිරීම සඳහා සරල මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් පිළියෙල කළ යුතුවේ.

<u>අභ්‍යාස</u>

1.අසම්පූර්ණ වාර්තා ඇති වීමට හේතු 5ක් ලියන්න.

2.අසම්පූර්ණ වාර්තා පැවති ව්‍යාපාරයක විධිමත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වීමට හේතු මොනවාද?

3.අසම්පූර්ණ සටහන්වල සීමාවන්/අවාසි මොනවාද?